## ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතිය - 2020

ස්ථායිකරණ ක්‍රමවේද මගින් නාය යෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජය හා ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව අතර, 2019 අප්‍රේල් 25 දින එළඹි අංක. එල් - 0124 ඒ දරණ ණය ගිවිසුමේ II බී (3) පරිච්ඡේදය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුවට වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් හා නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා කාල සීමාව

ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, රාජ්‍ය ආරක්ෂක සහ ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. නායයෑම් කළමනාකරණය කිරීම සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති හා රෙගුලාසි වැඩිදියුණු කිරීම තුළින් සහ ආපදා අවම කිරීමේ භෞතික ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම තුළින් නායයෑම්වලින් සිදුවන අවදානම් සහ හානි අවම කිරීම, ව්‍යාපෘතියේ අරමුණ වේ. ව්‍යාපෘතියේ ණය ගිවිසුම අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය, එක්සත් ජනපද ඩොලර් මිලියන 110 කට සමාන රුපියල් මිලියන 19,976 ක් වී තිබුණු අතර, එම ණය මුදලින් එක්සත් ජනපද ඩොලර් මිලියන 80 කට සමාන රුපියල් මිලියන 14,528 ක් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් මූල්‍යකරණය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කටයුතු 2019 ජූලි 01 දින ආරම්භ කර තිබුණු අතර, එය 2023 ජූනි 30 දින වනවිට අවසන් කිරිමට නියමිතව ඇත.

### 1.3 මතය

මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම් පිළිබඳ ප්‍රකාශය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විසින් විගණනය සිදුකරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් වන විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැලසීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත වන බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව සත්‍ය හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

**1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතික වීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිත ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හා වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැක මුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද:

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇති වන්නා වූ අවදානම් මඟ හරවා ගැනීමට, ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීම වංචාවක් ඇති වීමට හේතු වේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගන්නා ලද නමුත් අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල කළමනාකරණය විසින් කරන ලද සාධාරණත්වය හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර, ඒ සඳහා පාදක වූ ගණුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දූර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

**2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්**

**2.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | ගිණුම්කරණ අඩුපාඩු | වටිනාකම | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| | | රු. | | |
| (අ) | සමාලෝචිත වර්ෂයට අදාල බැදීම් ගාස්තු, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 37,019,009 | විගණක සමඟ එකඟ වේ. | බැදීම් ගාස්තු, මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2019 වර්ෂය තුළදී ණය මුදලින් අඩු කරගත් ප්‍රාග්ධනිත පොළී වියදම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 3,616,038 | විගණක සමඟ එකඟ වේ. | ප්‍රාග්ධනිත පොළී වියදම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර දැක්වීමට කටයුතු කළ යුතු වේ. |
| (ඇ) | සමස්ථ උපදේශක ගාස්තු වලින් ආසන්න වශයෙන් සියයට 21 ක ප්‍රමාණයක් වූ පරිවර්තන ගාස්තුව, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල වෙනත් එක් අයිතමයක් ලෙස වෙන් කර දැක්වීමට කටයුතු කර නොතිබුණි. | 1,830,860 | පිළිතුරු ලබා දී නොමැත. | උපදේශක ගාස්තු තුල ඇතුළත් කර ඇති පරිවර්තන ගාස්තුව, මූල්‍ය ප්‍රකාශනවල වෙනත් එක් අයිතමයක් ලෙස වෙන් කර දැක්වීමට කටයුතු කළ යුතු වේ. |

**2.2** රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| අංකය | රීති සහ රෙගුලාසි සඳහා යොමුව | අනුකූල නොවීම් | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | මුදල් රෙගුලාසි අංක 756 | ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් 2020 වර්ෂයට අදාලව සිදුකරන ලද භාණ්ඩ සමීක්ෂණ වාර්තා සමාලෝචිත වර්ෂය තුළදී ඉදිරිපත් කර නොතිබුණි. | 2021 වර්ෂය තුල භාණ්ඩ සමීක්ෂණ කටයුතු, සිදුකිරීම සඳහා අවශ්‍ය වන සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසිවල පෙන්වා දී ඇති නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ. |
| (ආ) | ව්‍යාපෘතිය වෙනුවෙන් පිළියෙල කරන ලද මූල්‍ය කළමනාකරණ අත්පොතෙහි II පරිච්ඡේදයේ 2.2 ඡේදය | මූල්‍යකළමනාකරණ අත්පොතෙහි සඳහන් පරිදි, පූර්ණ කාලීන සුදුසුකම් ලත් ව්‍යාපෘති ගණකාධිකාරීවරයකු බඳවා ගැනීම, විගණිත දිනය වූ 2021 මාර්තු 31 දින දක්වාම සිදු කර නොතිබුණි. | පූර්ණ කාලීන සුදුසුකම් ලත් ව්‍යාපෘති ගණකාධිකාරීවරයකු 2021 මැයි මාසය තුලදී බඳවා ගෙන ඇත. | මූල්‍ය කළමනාකරණ අත්පොතෙහි පෙන්වා දී ඇති නියමයන්ට අනුකූලව කටයුතු කළ යුතු වේ |
| (ඇ) | ව්‍යාපෘතිය වෙනුවෙන් පිළියෙල කරන ලද මූල්‍ය කළමනාකරණ අත්පොතෙහි VII පරිච්ඡේදය | ව්‍යාපෘති කළමනාකරණ ඒකකය වෙත අභ්‍යන්තර විගණක වරයකු පත් කර ගැනීමට කටයුතු කළ යුතු වුවත්, විගණිත දිනය වූ 2021 මාර්තු 31 දින දක්වාම අදාල බඳවා | මූල්‍ය කළමනාකරණ අත්පොතෙහි අභ්‍යන්තර විගණක වරයකුගේ තනතුරක් සම්බන්ධයෙන් සඳහන් කර තිබුණ ද, කළමනාකරණ සේවා | අභ්‍යන්තර විගණක වරයකු බඳවා ගැනීමට කටයුතු කළ යුතු වේ. |

| | |
|---|---|
| ගැනීම සිදු කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් උක්ත තනතුර සඳහා බඳවා ගැනීම අනුමත කර නොතිබුණි. |

**3.** **භෞතික කාර්යසාධනය**

**3.1** **ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම්වල භෞතික සහ මූල්‍ය ප්‍රගතිය**

**ව්‍යාපෘතියේ කාර්යයන්, සංරචක හතරක් යටතේ ක්‍රියාත්මක වේ. එනම්,**

**(අ) අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම**
**(ආ) ප්‍රතිපත්ති, ප්‍රමිති සහ ආයතනික ධාරිතාව වැඩි දියුණු කිරීම**
**(ඇ) අත්‍යාවශ්‍ය පහසුකම් සැපයීම සහ**
**(ඈ) උපකරණ සහ තාක්ෂණික සහාය සහ ව්‍යාපෘති කළමනාකරණය**

| අංකය | සංරචකය | විගණන ගැටළු | කළමනාකරණයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
|---|---|---|---|---|
| (අ) | සංරචක අංක - 01 | ව්‍යාපෘතියේ සංරචක අංක - 01 යටතේ ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛතා වැඩ බිම් 147ක ක්ෂේත්‍ර පරීක්ෂණ, සවිස්තරාත්මක සැලසුම්, ඉදිකිරීම් සහ අධීක්ෂණ කළමනාකරණය සඳහා එක්සත් ජනපද ඩොලර් මිලියන 97ක් වෙන් කර තිබුණු අතර ඉන් වැඩ බිම් 27ක සිවිල් වැඩ කටයුතු, කොන්ත්‍රාත් වැඩ පැකේජ 04 ක් යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 15.22 ක වටිනාකමකට තක්සේරු කොට 2019 වර්ෂයේදී ප්‍රදානය කිරීමට තීරණය කරන ලදී. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුළ ප්‍රදානය කර තිබුණේ එක්සත් ජනපද ඩොලර් මිලියන 5.2ක වටිනාකමින් යුත් කොන්ත්‍රාත් වැඩ පැකේජ 02ක් පමණි. | 2019 අප්‍රේල් 21 පාස්කු ඉරු දින සිදු කරන ලද බෝම්බ ප්‍රහාරය සහ 2020 වර්ෂය තුල ඇතිවූ කොවිඩ් 19 වසංගතය හේතුවෙන් ඉතිරි පැකේජ වල ප්‍රසම්පාදන කටයුතු ප්‍රමාද විය. | ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරමින් සහ කොන්ත්‍රාත් වැඩ නියමිත කාලය තුල අවසන් කිරීම තුලින් අතිරේක වියදම් මග හරවා ගැනීමට පියවර ගත යුතු වේ. |
| (ආ) | | වැඩබිම් 120 ක ඉතිරි සිවිල් වැඩ කටයුතු, කොන්ත්‍රාත් වැඩ පැකේජ 08 ක් යටතේ එක්සත් ජනපද ඩොලර් මිලියන 64.3 ක වටිනාකමකට තක්සේරු කොට, 2020 වර්ෂය තුලදී අදියර -2 යටතේ ප්‍රදානය කිරීමට තීරණය | ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සහ කොන්ත්‍රාත් ප්‍රදානය කිරීමේ කටයුතු ප්‍රමාද වීමට අයහපත් කාලගුණික තත්වයන් ඇතිවීම, පාස්කු ඉරිදා | ප්‍රමාදයන් වලක්වා ගැනීමට කටයුතු කරමින් සහ කොන්ත්‍රාත් වැඩ නියමිත කාලය තුල අවසන් කිරීම තුලින් අතිරේක වියදම් මග හරවා ගැනීමට |

| | | | | |
|---|---|---|---|---|
| | | කර තිබුණි. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය තුල කිසිදු හෝ කොන්ත්‍රාත්තුවක් ප්‍රදානය කර නොතිබුණි. | සිදුකරන ලද ප්‍රහාරය සහ කොවිඩ් 19 වසංගත තත්ත්වය ඇතිවීම බලපා තිබුණි. | පියවර ගත යුතු වේ. |
| (ඇ) | සංරචක අංක - 02 | මෙම සංරචකය යටතේ 2019 හා 2020 වර්ෂයන් තුල එක්සත් ජනපද ඩොලර් මිලියන 3.0 ක වටිනාකමකට උපදේශන සේවා කොන්ත්‍රාත්තු 03 ක් ලබා ගැනීම පිණිස දැන්වීම් පළකිරිමට අවශ්‍යතාවයක් ඇතිවී තිබුණි. කෙසේ වෙතත්, උක්ත උපදේශන සේවා කොන්ත්‍රාත්තු සඳහා දැන්වීම් පළකිරීමේ කටයුතු 2020 වර්ෂය තුළදී හෝ සිදුකර නොතිබුණි. | 2020 හා 2021 වර්ෂ තුළ කොවිඩ් 19 වසංගත තත්ත්වය ශ්‍රී ලංකාව පුරා ව්‍යාප්ත වීම හේතුකොට ගෙන මෙම ක්‍රියාකාරකම් කල් දැමීමට සිදුවිය. | ව්‍යාපෘතියෙන් නියම කර ඇති ඉලක්කවලට අනුගත වීම සඳහා පියවර ගත යුතුය. |

**3.2 ඌණ උපයෝජිත වත්කම්**

| විගණන ගැටළුව | කළමනාකරණයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| ව්‍යාපෘතිය විසින් සකස් කරන ලද විස්තරාත්මක ඉලක්ක ගත පිරිවැය ඇස්තමේන්තුවට අනුව ඉකුත් වර්ෂය අවසානය වන විට පිළිවෙලින් ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව විසින් ලබා දීමට අපේක්ෂිත ණය මුදලේ දායකත්වය රුපියල් මිලියන 5,670.80 ක් ද, ශ්‍රී ලංකා රජය විසින් ලබාදීමට අපේක්ෂිත අරමුදලේ දායකත්වය රුපියල් මිලියන 2,016 ක් ද වි තිබුණි. කෙසේ වෙතත් 2020 දෙසැම්බර් 31 දින වනවිට ආසියානු යටිතල පහසුකම් ආයෝජන බැංකුව මගින් ලබාදුන් ණය මුදලේ මුළු උපයෝජිත වටිනාකම රුපියල් මිලියන 145.47 වී තිබුණු අතර රජයේ අරමුදල් වල මුළු උපයෝජිත වටිනාකම රුපියල් මිලියන 228.84 ක් ද වි තිබුණි. එම උපයෝජිත ප්‍රතිශතයන් පිළිවෙලින් සියයට 2.57 ක් සහ සියයට 11.35 ක් ද වී තිබුණි. | කොවිඩ් 19 වසංගතය ශ්‍රී ලංකාව තුළ පැතිරී යාම හේතුවෙන් ඉලක්කගත වැඩ කටයුතු අපේක්ෂිත කාලය තුළ අවසන් කිරීමට නොහැකි වූ අතර එම හේතුවෙන් ක්ෂේත්‍ර වැඩ කටයුතු, ටෙන්ඩර් පිරිනැමීමේ කටයුතු සහ තක්සේරු කිරීමේ කටයුතු ද නිසි කලට නිම කිරීමට නොහැකිව තිබිණි. | ව්‍යාපෘතිය විසින් නියම කරනු ලබන ඉලක්ක වලට අනුගතවී කටයුතු කිරීමට පියවර ගත යුතු වේ. |

**3.3** මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ගැටළු

| අංකය | විගණන ගැටළු | කළමණාකරනයේ අදහස් දැක්වීම් | විගණකගේ නිර්දේශයන් |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂය සඳහා අවශ්‍ය වූ තනතුරු 23 කට අදාල පුරප්පාඩු 41 ක කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා අනුමැතිය ලැබී තිබුණ ද, තනතුරු 15 කට අදාල පුරප්පාඩු 23 ක් වෙනුවෙන් වූ බඳවා ගැනීම්, 2020 දෙසැම්බර් 31 දින වන විටත් සිදු කර නොතිබුණි. | තනතුරු කිහිපයක් සඳහා 2020 වර්ෂය තුළදී බඳවා ගැනීම් සිදු කර තිබුණු අතර සමහර තනතුරු සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනයේ සේවකයන් යොදවා ගෙන අර්ධකාලීන පදනම යටතේ බඳවා ගැනීම් සිදු කරන ලදී. | ව්‍යාපෘතියේ ක්‍රියාකාකාරිත්වය සුමට අන්දමින් පවත්වා ගෙන යාම සඳහා නිලධාරින්ගේ බඳවා ගැනීමේ කටයුතු චක්‍රලේඛවල නියමයන්ට අනුකූලව සිදු කළ යුතු වේ. |
| (ආ) | දැනට පවතින පුරප්පාඩු 23 කින් පුරප්පාඩු 15 ක් ම, විධායක මට්ටමේ තනතුරු 11 කට අදාළව පවතින පුරප්පාඩු බව ද නිරීක්ෂණය විය. | තනතුරු කිහිපයක් සඳහා 2020 වර්ෂය තුළදී බඳවා ගැනීම් සිදු කර තිබුණු අතර සමහර තනතුරු සඳහා ජාතික ගොඩනැගිලි පර්යේෂණායතනයේ සේවකයන් යොදවා ගෙන අර්ධකාලීන පදනම යටතේ බඳවා ගැනීම් සිදු කරන ලදී. | ව්‍යාපෘතියේ ක්‍රියාකාකාරිත්වය සුමට අන්දමින් පවත්වා ගෙන යාම සඳහා නිලධාරින්ගේ බඳවා ගැනීමේ කටයුතු චක්‍රලේඛවල නියමයන්ට අනුකූලව සිදු කළ යුතු වේ. |